





# කලා ක්ෂේත්‍රයේ දිගු ගමනක් යන එක තමයි බලාපොරොත්තුව

## SHEHAN MADUSANKA

**කොහොමද? මොකද කරන්නේ මේ දවස්වල?**

පරිස්සමට හොඳින් වැඩකටයුතු කරගෙන ඉන්නවා. රටේ මේ වෙද්දි පවතින කොවිඩ් 19 තත්ත්වයත් එක්ක අපි පරිස්සමෙන් වැඩ කර ගන්න ඕනිනේ.

**අපි කැමැතියි ඔබ කවුද? මොනවද කරන්නේ කියලා දැනගන්න.**

මම ගැන... මම ගැන කියනවා නම් මගේ නම ඩී. ෂෙහාන් මධුෂංක. ඒ වගේම මම BOI එකේ රැකියාවක් කරනවා.

**ඒ වගේම ඔයාගේ පෞද්ගලික තොරතුරු ටිකක් දැනගන්නත් අපි කැමැතියි.**

ම්ම්ම්... මම තාම වයස අවුරුදු 20ක කොල්ලෙක්. පදිංචිය නම් හීනටියන. එතකොට ඉස්කෝලේ ගියේ හීනටියන ධම්මාලෝක මහා විද්‍යාලයට. මේ වෙද්දි ඉතින් අධ්‍යාපන ඉවර කරලා රැකියාවක නිරත වෙමින් සිටිනවා.



**පවුලේ විස්තර මොනවද?**

මගේ පවුලේ මට ඉන්නේ තාත්තයි අම්මයි අක්කයි.

**රංගනයට යොමුවන්නේ කොහොමද?**

රංගනයට යොමුවෙලා මේ වෙද්දි අවුරුද්දක් විතර වෙනවා. දන්න කියන මිතුරෙකුගෙ හරහා තමයි මං රංගනයට යොමු වුණේ. ඉතින් ඒ තැබූ පියවර තවදුරටත් ඉදිරියට ගමන් කරන්න තමයි මගේ අදහස.

**මේ වන විට රංගනයෙන් දායක වී ඇති දෑ ගැන කිව්වොත්....**

වෙළෙඳ දැන්වීම් කිහිපයකට රංගනයෙන් දායකත්වය සපයලා තියෙනවා. ඒ වගේම ඉරාජ් වීරරත්න අයියාගේ මියුසික් වීඩියෝ එකක සෙසු චරිතයකටත් මං රංගනයෙන් දායකත්වය සපයලා තියෙනවා.

**ඒ වගේම ඉදිරියේදී කුමන නිර්මාණවලින්ද දැකගන්න පුළුවන් වෙන්නේ.**

No Nine සහ වස්සුනු කියන නිර්මාණ දෙකට මම දායකත්වය සපයලා තියෙනවා.

**මේතාක් පැමිණි කාලය තුළ ඔබ ලැබූ අත්දැකීම් ගැන සඳහන් කළොත්.**

ඇත්තටම හොඳ අත්දැකීම් රැසක් ලැබුණා. කලා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් ඇසුරෙහි සුහදව කටයුතු කිරීම තුළින් කලාව සම්බන්ධයෙන් ලොකු දැනුමක් මට ලැබුණා.

**මේ ගමනට උදව් උපකාර කරන්නේ කවුද?**

මගේ මේ ගමනට උදව් උපකාර කරපු බොහෝ දෙනෙක් ඉන්නවා. ඒ අතරින් දිල්රුක්ෂි මිස් සහ මගේ සේවා ස්ථානයේ සරත් සර් වගේම නිලුක්ෂාන්, සුපුන් සහ ඉසුරු කියන මගේ මිතුරන් මේ අවස්ථාවේ විශේෂයෙන් මතක් කරනවා.

**අවසන් වශයෙන් මොනවද ඉදිරි බලාපොරොත්තු ?**

මගේ රැකියාව කරගෙන යන අතරතුරදීම කලාව හදාරමින් කලා ක්ෂේත්‍රයේ දිගු ගමනක් යාම තමයි මගේ බලාපොරොත්තුව. ඒ සඳහා මම උපරිම උත්සාහයක් දරනවා.

**ඔබ සම්බන්ධ කර ගන්නේ කෙසේද?**

මගේ දුරකථන අංක හරහා වගේම මගේ ෆේස්බුක් ප්‍රොෆයිල් එක හරහා මාව සම්බන්ධ කර ගන්න පුළුවන්. ෆේස්බුක් එකේ ෂෙහාන් මධුෂංක කියලා මගේ ප්‍රොෆයිල් එක තියෙනවා. මගේ දුරකථන අංක වන්නේ 070 291 3927 වගේම 070 327 7823.

අනුර ප්‍රේමකුමාර
පිටු සැකසුම LANKAYOUTH.COM

මෙවැනි ලිපියක් ලංකායූත් වෙබ් අඩවියේ පළ කරගැනීමට ඔබත් කැමැතිනම් 0718 548 549 වට්ස්ඇප් අංකයට කතා කරන්න.